පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : පෙරදිග සංගීතය

සතිය : හයවන සතිය

ශ්‍රේණිය : 06

සකස් කිරීම : W.S.D. ලසන්ත ප්‍රනාන්දු මයා
කෑ/මාව/දැලිවල ම.වි -මාවනැල්ල

මාත්‍රා, ලඝු අක්ෂර, ගුරු අක්ෂර, ප්ලුත අක්ෂර

මාත්‍රා

තාලයක් තුළ ඇති කුඩාම මිම්ම මාත්‍රාවයි. මාත්‍රා කිහිපයක් එකතුවීමෙන් තාලයක් සෑදේ.

ලඝු අක්ෂර

නොඇදෙන කෙටිම අකුරු ලඝු අකුරුවේ. උච්චාරණය කිරීමට ගතවන්නේ කෙටි කාලයකි. ලඝු අකුරක වටිනාකම මාත්‍රා එකකි.

උදාහරණ :- දි ය ගො ඩ සැ ම තැ න (මෙහි ලඝු අක්ෂර 08 ඇත)

ගුරු අක්ෂර

දීර්ඝ අකුරු නැතහොත් අදෙන අකුරු ගුරු අක්ෂර ලෙස හැඳින්වේ. ගුරු අකුරක් උච්චාරණයට ගතවන කාලය ලඝු අක්ෂරයක් මෙන් දෙගුණයකි. ගුරු අකුරක වටිනාකම මාත්‍රා 02 කි.

උදාහරණ :- මාමා, නෑයා, ආවා, බූලා

ප්ලුත අක්ෂර

ගුරු අකුරක් ඉදිරියෙන් හල් අකුරක් යෙදීමෙන් ප්ලුත අක්ෂරයක් උපදී. දීර්ඝතම ඇදෙන අක්ෂරය වන ප්ලුත අක්ෂරයේ වටිනාකම මාත්‍රා 03 කි. උදාහරණ :- හාල්, පාන්, ජෑම්

ක්‍රියාකාරකම පහත වාක්‍යයේ ලඝු, ගුරු සහ ප්ලුත අක්ෂර සොයමු

01- කාන්ති නැන්දා මට තාරාවෙක් ගෙනාවා.

කා න් ති නැ න් දා ම ට තා රා වෙ ක් ගෙ නා වා.

- ලඝු අක්ෂර - 08 මාත්‍රා 08
- ගුරු අක්ෂර - 05 මාත්‍රා 10 (5 x 2)
- ප්ලුත අක්ෂර - 01 මාත්‍රා 03 (1 x 3) ඉහත වාක්‍යයේ මුළු මාත්‍රා සංඛ්‍යාව 21 කි.

පැවරුම්

01- ලඝු, ගුරු, ප්ලුත අක්ෂර යනු කුමක්දැයි විස්තර කරන්න

02- මාත්‍රාවක් යනු කුමක්දැයි හඳුන්වන්න

03- පහත වාක්‍යවල ලඝු,ගුරු,ප්ලුත අක්ෂර සොයා එක් එක් වාක්‍යයේ මුළු මාත්‍රා ගණන සොයන්න

1 - පාන් මාමා උදෙන්ම මට ජෑම් පාන් එකක් ගෙනත් දුන්නා

2 - රෑන් රෑන් ගිරව් පාන්දරින්ම කෑම සොයන්න යනවා

3 - මල්ලි හාල් පිටි ආප්ප කෑමට ගොඩක් කැමතිය

4 - පාසලේ විවිධ ප්‍රසංගය රැස්වීම් ශාලාවේ පවත්වන ලදි